## 13 ශ්‍රේණිය ව්‍යාපාර සංඛ්‍යානය 7 වන සතිය - ජූනි 15 සිට 19 දක්වා

## 10.4 - නිෂ්පාදිත පාලනය සඳහා උචිත ක්‍රමවේද භාවිත කරයි.

- සමහර අවස්ථාවලදී තොගයෙහි ඇති සියලුම ඒකක පිරික්සීමට භාජනය කළ නොහැකිය.
- සියලුම ඒකක පිරික්සීම මගින් තොගයක් පිළි ගන්නවාද,ප්‍රතික්ෂේප කරනවාද යන්න තීරණය කිරීම නිවාරණ පිරික්සීමක් ලෙස හඳුන්වනු ලැබේ.
- නිවාරණ පිරික්සුමක් සිදු කිරීම කාලය සහ පිරිවැය විශාල වශයෙන් වැයවන ක්‍රමයකි.
- පරීක්ෂා කිරීමේදී ඒකක විනාශයට පත් වන අවස්ථාවල නිවාරණ පිරික්සීමක් ප්‍රායෝගික නොවේ.
- තොගයෙන්,තොග නියැදියක් පිරික්සුම වර්තමානයේදී කර්මාන්ත ක්ෂේත්‍රයේ තොග පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සඳහා භාවිත වන ප්‍රචලිත ක්‍රමයකි.
- නියැදියක් පරීක්ෂා කර තොගයක් පිලිගන්නේද නැද්ද යන්න තීරණය කිරීම පිළිගැනුම් නියැදි සැලැස්ම යනුවෙන් හඳුන්වනු ලබන සංඛ්‍යානමය සැලැස්මක් බොහෝ ආයතන විසින් යොදා ගනු ලැබේ.
- මිළදී ගනු ලබන තැනැත්තා (පාරිභෝගිකයා) තොග මිළදී ගැනීමට ප්‍රථම ඒවා පූර්ව නිශ්චිත ප්‍රමිතීන්ට අනුකූලව පවතීදැයි තහවුරු කර ගැනීමට මෙවැනි සැලැස්මක් උපයෝගී කර ගනු ලැබේ.

**අභ්‍යාස**

1.නිෂ්පාදිත පාලනය යනු කුමක්ද?

2.පිළිගැනුම් නියැදි සැලැස්මක ඇති අංග 3 නම් කරන්න.

3.මෙහෙයුම් ලාක්ෂණික වක්‍රය හෙවත් OC වක්‍රය ලෙස යන්න පහදන්න.

4. OC වක්‍රයක ප්‍රයෝජන මොනවාද?

5 පිළිගැනුම් සැලැස්මකට අනුව n=40 සහ C=2 වේ.

(1.) පහත එක් එක් තොගය පිළිගැනීමේ සම්භාවිතා ගණනය කරන්න.

1).1 %ක් දෝෂ සහිත තොගය

2.)2 % ක් දෝෂ සහිත තොගය

3.) 5 % ක් දෝෂ සහිත තොගය

4.) 6.25 % ක් දෝෂ සහිත තොගය

(2.) ඉහත 1.) අවස්ථාවේදී නිෂ්පාදකයාගේ අවදානමත් ඉහත 4.) අවස්ථාවේදී පාරිභෝගිකයාගේ අවදානමත් ගණනය කරන්න.